# වගකීම් සහගත වන කළමණාකරනය

ලෝකයේ ස්වාභාවික රබර් නිෂ්පාදනය කිරීමේ හොඳම වැවිලි කළමණාකරන සමාගමක් වීමේ ඒකායන අරමුණින් යුතුව අදාල කෘෂිකාර්මික සහ මානව සම්පත් සංවර්ධන කටයුතු සම්පාදනය කිරීමේ නිරතව ඇති ඔබත් මමත් පරිසර හිතකාමීව සහ වගකීමකින් යුතුව අපගේ මානව සම්පත සෞඛ්‍ය සම්පන්නව හා ආරක්ෂාකාරී අන්දමින් මෙහෙයවීමට ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගෙන ඇත්තෙමු.

එම කටයුතු වඩාත් විනිවිදභාවයකින් යුක්තව සහ අන්තර්ජාතිකව පිලිගැනෙන Forest Stewardship Council™ (වනාන්තර භාරකාර මණ්ඩලයේ) FSC™ අධීක්ෂණයෙන් යුක්තව කරගෙන යාමට සමාගමේ සභාපතිතුමා ප්‍රමුඛ ඉහල කළමණාකාරිත්වය ප්‍රතිපත්තිමය වශයෙන් තීරණයක් ගෙන ඇත. ඒ අනුව අපගේ රබර් වගාවත් අපට අයත් වනාන්තර සහ වෙනත් වගාවනුත් එම වගකීම් සහගත වනාන්තර කළමණාකරන සංකල්පය අනුව සිදු කෙරෙනු ඇත.

මතු අනාගතය වෙනුවෙන් වනාන්තර ආරක්ෂා කිරීම සඳහා භාවිතාවෙන සරල නීතින් පහත පරිදි වේ.

01. වසරකදී වගා කරන ප්‍රමාණයන්ට වඩා වැඩි ප්‍රමානයක් කපා ඉවත් කිරීම නොකල යුතුය.
02. පවතින ගස් ප්‍රමාණය ප්‍රමාණවත් නොවන විට අලුතෙන් පැල සිටුවා ස්වභාවිකව වර්ධනය වීමට ඉඩ හැරීම
03. වනාන්තරයට විය හැකි හානි අවම කරන අතරම වනාන්තරය තුල මාවත් තැනීම අවම කිරීම
04. උචිත වන කළමණාකරන ක්‍රමයක් තුලින් වන වගාව පාලනය කිරීම
05. වනාන්තර තුල විශාල ප්‍රමාණයේ මියගිය ශාක කෘමීන්ගේ හා සතුන්ගේ වාසභූමි සඳහා ඉතිරි කිරීම
06. සතුන් දඩයම් නොකිරීම
07. කිසිම විටෙක වනාන්තරය තුල කුණුකසල හෝ තෙල් රසායනික ද්‍රව්‍ය ඉහිරීම වලක්වා ගැනීමට වග බලා ගැනීම.

මෙම සරල නීති හොඳින් පිළිපැදීමෙන් මතු පරම්පරාව වෙනුවෙන් වන වගා ආරක්ෂා වනු ඇත.

ලොව පුරා වන වගා අයිතිකරුවන් තම තමන්ගේ වන වගා වගකීම් සහගත ලෙස කලමණාකරනය කරන බවට පවසා සිටියත් එවැනි තත්ත්වයක් සත්‍යය වශයෙන්ම පවතිනවාදැයි නිශ්චය කරගැනීමට ක්‍රමවේදයක් තිබිය යුතුවේ. මෙම කටයුත්ත ඉෂ්ඨ කිරීම සඳහා ස්වාධීන සංවිධානයක් වශයෙන් 1993 දී Forest Stewardship Council™ (වනාන්තර භාරකාර මණ්ඩලය) පිහිටුවා ගනු ලැබිණි. මෙම ආයතනය පරිසර හිතකාමී රාජ්‍යය නොවන සංවිධානයන්ගේ අනුග්‍රහයෙන් පවත්වාගෙන යනු ලබයි. ලෝකයේ ඕනෑම වන වගාවක් වගකීම් සහගත ලෙස යහ කළමණාකරනයෙන් යුතුව පවත්වාගෙන යන්නේද යන්න සහතික කිරීමට මෙම සමාගමේ බලයලත් සහතිකකරන සමාගම් විසින් සිදුකරනු ලබයි.

එම සමාගම් වලට වන වගාවන් වගකීම් සහගත ලෙස පාලනය කෙරෙන්නේදැයි තහවුරු කිරීමට බලයක් ඇත. යම් වන වගාවක් වගකීම් සහගතව සහ යහ පාලනයෙන් පවත්වාගෙන යනු ලබන අවස්තා වලදී ඔවුන්ගේ ලාංඡනය නිෂ්පාදන සහතික කිරීම සඳහා භාවිතා කිරීමට අනුමැතිය දෙනු ලැබේ. මෙම ලාංඡනය සහිත භාණ්ඩ සඳහා අන්තර්ජාතිකව උසස් පිළිගැනීමක් ලැබේ. මෙම සමාගම එම වන වගාවන් පොරොන්දු වූ පරිදි වගකීම් සහගත ලෙස පවත්වා ගෙන යන්නේදැයි පරීක්ෂා කිරීම සඳහා වාර්ෂිකව පැමිණෙනු ඇත.

ස්තුතියි

Forest Stewardship Council™ (FSC™ - C101709)

වතු කළමණාකාරීත්වය